# දැන්වීමයි

## වැල්ලමඩම සංකීර්ණයේ පීඨවල නේවාසික පහසුකම් හිමිව පවතින ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ දැනගැනීම සඳහා

නේවාසිකාගාරයේ මධ්‍යසාර බීමවර්ග, ,මත්ද්‍රව්‍ය භාවිතය හෝ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ළඟතබාගැනීම, පරිභෝජනය කිරීම සහ පරිභෝජනය කර නේවාසිකාගාරයට පැමිණීම, දුම්පානය කිරීම විනය විරෝධී වේ.

මේ සම්බන්ධව ඉදිරියේදී නිරන්තර පරීක්ෂාකිරීම් නේවාසිකාගාර පිවිසුමේදී මෙන්ම නේවාසිකාගාර තුළද සිදුකරන අතර දිවා හෝ රාත්‍රී කාලයේ ඕනෑම මොහොතක ඒ සඳහා සහාය වීම නේවාසික සිසුන්ගේ වගකීමක් වේ.

තවද, නේවාසිකාගාර පහසුකම් හිමි නොමැති ශිෂ්‍ය/ශිෂ්‍යාවන් නේවාසිකාගාරවලට නිසි අවසරයක් ලබා නොගෙන ඇතුළු වීම සහ නේවාසිකාගාරයේ රැඳී සිටීම නොකළ යුතුය.

එසේ අනවසරයෙන් නෙවාසිකාගාගාරයේ රැඳී සිටින සිසුන්ට විරුද්ධව නේවාසිකාගාර අතුරු නීතිය අනුව කටයුතු කරන අතර අනවසර සිසුන්/පුද්ගලයන් රඳවා තබාගනු ලබන නේවාසික සිසුන්ගේ නේවාසිකාගාර හිමිකම අහිමි කිරීමට පියවර ගනු ඇත.

ඉහත සඳහන් කරනු ලබන නීති රීති උල්ලංඝණය කරනු ලබන හෝ එම විධිවිධාන වලට එකඟව ක්‍රියා නොකරනු ලබන ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට ශිෂ්‍ය නේවාසික සහ විනය සම්බන්ධ අතුරු නීතිය අනුව කටයුතු කරන බව මෙයින් දන්වා සිටිමි.

27/06/2025

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී. ඒ. ජයන්ත
උපකුලපති
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.ඒ. ජයන්ත
උපකුලපති
2025.06.27

පිටපත - පීඨාධිපති /මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,විද්‍යා පීඨය,කළමනාකරණ හා මුල්‍ය පීඨය ,
ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය
ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක
නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක/ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, විද්‍යා පීඨය,
කළමනාකරණ හා මුල්‍ය පීඨය, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය
ශාලාධිපති/ශාලාධිපතිනි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, කළමනාකරණ හා මුල්‍ය පීඨය
සහකාර ලේඛකාධිකාරි/විද්‍යා පීඨය, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය
උපශාලාධිපති/වැල්මඩම සංකීර්ණයේ සියළුම පිරිමි නේවාසිකාගාර
උපශාලාධිපතිනි/වැල්මඩම සංකීර්ණයේ සියළුම කාන්තා නේවාසිකාගාර

PDF Scanner ACE Scanner